# සංස්කෘත අධ්‍යයන අංශය

පූජ්‍ය ආචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි

කැලණිය විශ්වවිද්‍යාලයීය සංස්කෘත භාෂා අධ්‍යයනාංශයේ ඉතිහාසය ගවේෂණය කිරීමේ දී විද්‍යාලංකාරය යන නාමය හා එය තදනුබද්ධ වේ. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මාහිමියන් හා තත් ශිෂ්‍යවර රත්මලානේ ධර්මාරාම මාහිමියන්ගේ ප්‍රමුඛත්වයෙන් විද්‍යාලංකාර සභාව නම් වූ දායක සභාවේ ආරාධනය පරිදි 1875 නොවැ. 01 දා ප්‍රාචීන භාෂා විද්‍යායතනයක් ලෙස විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ වේ.

1887 අගෝස්තු 15 දින රත්මලානේ ධර්මාලෝක නාහිමි අපවත් වූහ. 1918 මැයි 03 වන දා රත්මලානේ ධර්මාරාම නා හිමි අපවත් වූහ. තදනන්තරව පරිවේණාධිපති වූ ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද නාහිමියන් උපාධිපරීක්ෂා විභාගය හා ත්‍රිපිටක ධර්ම පරීක්ෂණය හඳුන්වා දී විද්‍යාලංකාර පිරිවෙන විශ්වවිද්‍යාල මට්ටමට ගෙන ඒමට ප්‍රබල ප්‍රයත්නයක නියුක්ත වූහ. මුල දී සිංහල පාලි සංස්කෘත, බුද්ධ ධර්මය වැනි විෂයයන්ට සීමා වූ අධ්‍යාපනය පසුව හින්දි, දෙමළ, ඉංග්‍රීසි, තර්ක ශාස්ත්‍රය, ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, මනෝ විද්‍යාව, පෙරපර දෙදිග දර්ශන සමඟක් මෙන්ම දේශීය වෛද්‍ය විද්‍යාව හා ජ්‍යොතිර් විද්‍යාව වැනි විෂය ධාරාවන් හදාරන්නට අවස්ථාව උදා වූයේ එම ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් හැටියටයි.

1945 ජූනි 18 දා ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද නා හිමි අපවත් වූ පසු පරිවේණාධිපති ධුරයට කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර හිමියන් පත්වන අතර නියෝජ්‍ය පරිවේණාධිපති ධුරය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන්ට හිමි වේ. උක්ත යතිවරුන් සංස්කෘත භාෂාව පිළිබඳ විශිෂ්ටයන් වූ හෙයින් ඊට මූලිකත්වයක් ලබා දී තිබිණ. යක්කඩුවේ ශ්‍රී පඤ්ඤාරාම, වල්පොල රාහුල, කාල් ඇල්ලේ ආනන්ද සාගර යනාදි සංස්කෘත පඬිවරුන්ගේ සේවය ද සංස්කෘත විෂය යාවත්කාලීන ව පවත්වා ගැනීමෙහි ලා ප්‍රයෝජනවත් විය.